# කැලණිය ප්‍රාදේශීය සභාව.

# ගම්පහ දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ ඇතුලත් මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කැලණිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ගිණුම් වලින් අත්හැරීම්

පහත සඳහන් ගිණුම් වලින් අත්හැරීම් නිරීක්ෂණය විය.

| | විස්තරය | අගය |
|---|---|---|
| | -------- | ------ |
| | | රු. |
| (i) | 2010 දෙසැම්බර් මාසයේ වැටුප් පතිපූර්ණ වලින් අඩුකර ගෙන නොතිබූ විශ්‍රාම වැටුප් දායකය | 134,001 |
| (ii) | ලැබිය යුතු මූල්‍යාධාර | 1,246,148 |
| (iii) | ගෙවිය යුතු ගබඩා ණයහිමියන් | 9,250,132 |
| (iv) | විමධ්‍යගත අරමුදල් යටතේ වැඩ නිමකර තිබූ ව්‍යාපෘති 07 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල | 1,234,570 |
| (v) | දළුගම උප කාර්යාලයේ 2010 ජනවාරි මාසයට අදාල මස්කඩ කුළී | 20,603 |

| | | |
|---|---|---|
| (vi) | ජාතික සන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ ධූමායන යන්ත්‍රයේ වටිනාකම ( | සඳහන් නොවේ |
| (vii) | මිලදී ගෙන තිබූ ත්‍රිරෝද රථයේ වටිනාකම ( | 328,160 |
| (viii) | දැන්වීම් පුවරු 20 ක් ඉදි කිරීම සඳහා වූ වැය ( | 51,000 |
| (ix) | සේවිකයින්/ නිලධාරීන් 10 දෙනෙකුගෙන් ලබා ගෙන තිබූ සේවක ඇප රු.41,825 ක් සහ උපලබ්ධි වී තිබූ සේවක ඇප් ආයෝජන ) | 49,659 |

(ආ) <u>සභා අනුමැතිය නොලැබූ ගනුදෙනු</u>

රු.33,972,902 ක ණයහිමි ශේෂය සහ විශ්‍රාම වැටුප් හිඟ දායක මුදල රු.792,434 ක් සභා අනුමැතියකින් තොරව ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

(ඇ) <u>ගිණුම්වල අඩුවෙන්/වැඩියෙන් දැක්වීම</u>

(i) රු.89,000 ක් වැය කර මිලට ගෙන තිබූ මුද්‍රණ යන්ත්‍රයේ වටිනාකම රු.1,000 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ii) 2006 වර්ෂයේ සිට විනෝද බදු ප්‍රතිපූර්ණය නවතා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.2,693,238 ක ශේෂය තුළ ප්‍රතිපූර්ණය නවතා තිබූ කාලයට අදාළව ප්‍රතිපාදනය කර තිබූ රු.1,601,091 ක ශේෂයක් විය.

(iii) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ 2011 ජනවාරි 26 දිනැති ලිපිය අනුව 2010 දෙසැම්බර් 31 දිනට හිඟ විශ්‍රාම වැටුප් දායකය රු.489,340 ක් වුවද, ගිණුම අනුව ශේෂය රු.107,402 ක් වුයෙන් විශ්‍රාම වැටුප් හිඟ දායකය රු.381,838 කින් අඩුවෙන් දැක්විණ.

(iv) ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබූ කාර්යාල උපකරණ වටිනාකම රු.395,930 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබූ උපකරණ වල වටිනාකම රු.395,800 ක විය.

(v) 2010 දෙසැම්බර් 31 දිනට පොදු සැපයුම් ණයහිමි ගිණුමේ රු.4,932,658 ක හර ශේෂයේ වර්ෂයට අදාලව පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| | | රු. |
|---|---|---|
| * | 2009 හා ඊට පෙර වර්ෂ වලට අදාළ ණයහිමියන්ට සමාලෝචිත වර්ෂය තුළදී ගෙවීම් කිරීම නිසා හර ශේෂයේ වැඩිවීම | 1,231,119 |
| * | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මාර්ග තලනයට ගෙවීම් පොදු සැපයුම් ණයහිමි ගිණුමට හර කර තිබීම | 230,600 |
| * | ගබඩා ලෙජරයෙන් වර්ෂයේ ගැණුම් වටිනාකම අඩුවෙන් උපුටාගෙන තිබීම | 2,459,026 |
| * | ගෙවීම් වවුචර් අනුව ණයහිමි ගිණුමට හර වී ගබඩා ලෙජරයට ඇතුලත්ව නොතිබූ ගැණුම් | 1,240,638 |
| * | 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වූ එහෙත් ණයහිමි වෙන්කිරීම් නොකළ ණයහිමියෝ | 1,658,718 |

(vi) 2009 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසි කිරීමට නිර්දේශ කර 2010 දෙසැම්බර් 10 දින වෙන්දේසි කරන ලද භාණ්ඩ විෂයයන් 27 ක ගත්මිල වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 **<u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයයන් 5 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 58,775,436 ක්වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.49,544,354 ක් විය.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

**<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.50,198,498 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 24(i)(ආ) | සභාව සතු පාරවල් සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් සකස් කර ගැසට් මගින් පළ කර නොතිබුණි. |
| (ii) 107(2) | සමාලෝචිත වර්ෂය තුළදී ඉවත් කරන ලද අනතුරුදායක ගස් 04 කට අදාලව ගෙවන ලද රු.12,000 ක මුදලක් අදාල පාර්ශවයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 132 (ඒ) වගන්තිය | ප්‍රජා පිළිගැනීම් සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුතු යම් සිද්ධි හෝ අවස්ථා පිළිබඳ උත්සව පැවැත්වීමට ගෙවීම් කිරීමේදී අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, එවැනි අනුමැතියක් නොමැතිව අවස්ථා 02 කදී රු.257,200 ක් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) 150 රීතිය | පී.එස්.5 ආකෘතිය ප්‍රකාර සභාව විසින් සාරාංශ මුදල් පොතක් පවත්වා ගත යුතු වුවත් සභාවේ ප්‍රධාන කාර්යාල හා උප කාර්යාල වෙනුවෙන් ප්‍රා.ස. 5 වාර්තා පවත්වා නොතිබුණි. |
| (ii) 155 රීතිය | ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පී.එස්.10 ආකෘතිය |

ප්‍රකාර ප්‍රධාන මුදල් පොතක් පවත්වා නොතිබුණි.

(iii) 178(2) රීතිය — යොමුගත රීතියට අනුකූල නොවන අයුරින් ගම නැගුම, මග නැගුම වැනි සංවර්ධන ව්‍යාපෘති අනුමත සමිති වලට පැවරීමට පෙර ප්‍රමාණවත් උපකරණ තමන් සතුව පවතින බව හා ප්‍රවීණ කාර්ය මණ්ඩලයක් තමා වෙත සිටින බව සහතික කිරීම සඳහා සහතිකයක් කොන්ත්‍රාත්කරු වෙතින් ලබා ගැනීමට ක්‍රියා කළ යුතු වුවත් තහවුරු කිරීමක් ලබා නොගෙන සංවර්ධන වැඩ සමිති වලට පවරා දී තිබුණි.

(iv) 217 රීතිය — සභාව සතු කරන ලද, සභාව විසින් ප්‍රයෝජනයට ගත්තා හා සභාව විසින් පදිංචියට ගත්තා ලද සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>

(i) මු.රෙ. 110 — හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ii) මු.රෙ.260 හා 389

(i) විජයබා ගොවි සංවිධානය මගින් කරන ලද කොන්ත්‍රාත් සඳහා ගොවි සංවිධානය නමින් චෙක්පත් නිකුත් නොකර වෙනත් පුද්ගලයෙකුගේ නමට හා ඔහුගේ පෞද්ගලික බැංකු ගිණුමට අවස්ථා 13 කදී රු.3,772,140 ක චෙක්පත් නිකුත් කර තිබුණි.

(ii) මාර්ග නඩත්තු ඒකකයේ 17 දෙනෙකු සඳහා 2009 දෙසැම්බර් මස අතිකාල දීමනා රු.45,717 ගෙවීමේදී සභා ලේකම්ගේ ලිඛිත නියෝග අනුව එක් සේවකයෙකුට සියළුම මුදල් ගෙවා තිබුණි

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,821,518 ක්වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,804,982 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.29,680 ක්වූ නිකුත් කළ දින සිට මාස 6 ඉක්මවූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 නොවැම්බර් මාසයේ බැංකු ගිණුම් දෙකකට අදාළ පිළිවෙලින් රු.482,372 ක හා රු.860,767 ක බැර ශේෂ ඇතිවන අයුරින් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 නියමයන්ට පටහැනිව චෙක්පත් ලියා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 317 ප්‍රකාර හැකි සෑම විටම අගුල් දෙකක් සහිත ආරක්ෂිත සේප්පුවක් භාවිතා කළ යුතු වුවත් සභාව විසින් තනි අගුලක් සහිත සේප්පුවක් භාවිතා කර තිබුණි.

(ඈ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 164 අනුව දවස අවසානයේ සේප්පුවේ මුදල් තැන්පත් කිරීමට ප්‍රථම සරප්ගේ මුදල් සාරාංශයක් පිළියෙල කර සියලුම ලැබීම් හා ගෙවීම් සසඳා සභාවේ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් පරීක්ෂා කර සහතික කිරීම කළ යුතු වුවත් දිනපතා සේප්පුගත කරන මුදල් එබඳු පරීක්ෂාවක් කර නොතිබුණි.

(ඉ) සභාවේ සංවර්ධන ව්‍යාපෘති එදිනෙදා කටයුතු වලින් නිදහස්ව පවත්වාගෙන යාම සඳහා කැළණිය මහජන බැංකුවේ ජංගම ගිණුමක් පවත්වා තිබුණද, නියැදි පරීක්ෂණයකදී නිරීක්ෂණය වූ අයුරු සමාලෝචිත වර්ෂයේදී පොදු ගිණුමට අදාළ රු.5,826,662 ක ගෙවීම්ද එකී ගිණුමෙන් ගෙවා තිබුණි.

(ඊ) 2010 දෙසැම්බර් 31 දින වන විට රු.38,110 ක් වූ අගරු චෙක්පත් 13 කට අදාළ මුදල් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 ප්‍රකාර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂය තුළ වසර 5-6 ක කාලයක් ගතවූ චෙක්පත්ද ඇතුළත් විය.

(උ) වියදම් ණයහිමි ලේඛනයේ කේවල ශේෂ එකතුව හා ගිණුම අනුව ශේෂය අතර වෙනස සහා අනුමැතියකින් තොරව ගිණුමෙන් කපා හැර තිබුණද, වෙනසට හේතු හඳුනාගෙන නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. එසේ වුවද, එම තොරතුරු ගිණුමේ දැක්වෙන සංඛ්‍යා හා නොසැසඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| ---------- | --------------- | ------- | ------------- | ------------------- | ------- | ----------- |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් බදු | 83,504 | 41,195 | 42,309 | 66,841 | 29,650 | 37,191 |
| බදු කුලී | 5,654 | 4,029 | 1,625 | 5,878 | 4,891 | 987 |
| බලපත්‍ර ගාස්තු | 1,182 | 406 | 776 | 1,551 | 746 | 805 |
| වෙනත් ආදායම් | 56,821 | 57,665 | - | 52,244 | 30,069 | - |

2.3.2 <u>මස්කඩ බදු</u>

මස්කඩ වාර්ෂිකව බදු දීම වෙනුවට 2009 ඔක්තෝබර් 19 දිනැති මුදල් කමිටු තීරණය පරිදි 2009 වර්ෂයේ දී මස්කඩ හතක් බදුගත් බදුකරුවන්ටම එම වර්ෂයේ ලන්සුව 10% ක් වැඩිකළ අගයට සමාලෝචිත වර්ෂය සඳහා බදු දී තිබුණි. එසේ තෝරාගත් බදුකරුවන්ගෙන් 2009 වර්ෂය සඳහා රු.396,130 ක බදු මුදල් හිඟව පැවති අතර, සමාලෝචිත වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම හිඟය පියවා ගෙන නොතිබුණි.

2.3.3 <u>කිරිබත්ගොඩ බස් නැවතුම්පළ ඇතුළත කඩ කාමර බදුදීම</u>

(i) 2006 වර්ෂයේදී ඉදිකරන ලද කිරිබත්ගොඩ බස් නැවතුම්පළ ඇතුළත පිහිටි කඩ කාමර 11ක්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව ව්‍යාපාර කටයුතු සඳහා බදුදී තිබූ අතර, 2010 ජූනි දක්වා එම කඩ කාමර වලින් සභාවට කිසිදු ආදායමක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ii) 2010 වර්ෂයේදී මෙම කඩ කාමර තුළ ව්‍යාපාර කටයුතු කළ ව්‍යාපාරිකයන් අතුරින් ව්‍යාපාරිකයන් පස්දෙනෙකු ඉවත්කර වෙනත් ව්‍යාපාරිකයන් පස්දෙනෙකුට ව්‍යාපාර කටයුතු සඳහා එම කඩ කාමර ලබාදී තිබුණි.

(iii) 2010 ජූනි 21 මුදල් කමිටු රැස්වීමේදී හා 2010 ජූලි 20 දින මහ සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණ මත රු.200,000 ට වැඩි ලංසුවට ඉල්ලුම්කරන බඳුකරුවන්ට මෙම කඩ කාමර ලබා දීමට තීරණය කර තිබුණද, එම කඩ කාමර තුළ ව්‍යාපාර කටයුතු කරමින් සිටි ව්‍යාපාරිකයන්ට අඛණ්ඩව රැඳී සිටීමට ඉඩකඩ සලසා තිබුණි. එහෙත්, සභාවට එකවර අයකර ගත යුතු මුදලින් රු.1,330,150 ක් අය නොවී හිගව පැවතුණු නමුත් එම මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. කඩහිමියන් සමග ගිවිසුම් වලට එළඹ නොතිබූ අතර මාසික කඩ කුලි අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 <u>කැලණිය බස්නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩ කුලියට දීම</u>

(i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු කැලණිය බස්නැවතුම්පල භූමියෙහි ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර තිබූ වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර 41 ක් බදු දීමට ටෙන්ඩර් කැඳවා තිබුණද, පළාත් පාලන කොමසාරිස්ගේ 2007 ජූලි 03 දිනැති අංක එල්ජීඩී/09/01/06/ජී14(එස්පීඑල්) දරන ලිපියෙන් කැලණිය බස්නැවතුම්පල භූමිය සභාව සතු කරගන්නා තෙක් ටෙන්ඩර් පිළිගැනීම සිදු නොකළ යුතු බව දන්වා තිබුණ. එයට අනුකූල වීමකින් තොරව කඩ කාමර 28 ක් බදුදී තිබූ අතර, බදුකරුවන්ගෙන් රු.10,851,783 ක පෙර මුදල් හිග හිට තිබුණි.

(ii) කැලණිය බස් නැවතුම්පලේ කඩ කාමර සඳහා කඩ හිමියන් සමග ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර, පහත මාලයේ කඩ කාමරයකින් මාසිකව රු.2,000 ක්ද උඩු මහලේ කඩ කාමරයකින් රු.1,000 ක්ද 2010 අගෝස්තු මස සිට අයකළ යුතු බව 2010 ජූනි 21 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මගින් තීරණය කර තිබුණද, විගණිත දිනය වූ 2011 ජනවාරි 26 දින වන විටද කඩ කාමර වලින් කඩ කුලී අයකර නොතිබුණි. ඒ අනුව 2010 අගෝස්තු සිට 2011 ජනවාරි දක්වා අයවිය යුතු හිග කඩ කුලිය බදු රහිතව රු.210,000 ක් විය.

2.3.5. <u>ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු</u>

ප්‍රචාරක දැන්වීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී දැන්වීම් පුවරු 11 ක් සඳහා පමණක් රු.384,600 ක් ලැබී තිබුණ අතර, ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් පුවරු පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණයක් කර නොතිබුණි.

(ආ) කැලණිය උප කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු 20 ක් සඳහා අයවිය යුතු වූ රු.960,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රචාරක දැන්වීම් භෞතිකව සමීක්ෂණය කර දළුගම උප කාර්යාලය මගින් වාර්තාවක් ලබා දීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 <u>ඉඩම් බදුදීම</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>හුණුපිටිය රබර්වත්ත ඉඩමෙන් වර්ග අඩි 100 ක බිම් කොටසක් බදු දීම</u>

2007 ජූනි 24 දිනැති මුදල් කමිටු තීරණය පරිදි හුණුපිටිය රබර් වත්ත ඉඩමින් වර්ග අඩි 100 ක් රු.10,000 ක මාසික කුලියකට 2007 අගෝස්තු 15 දින සිට වර්ෂ තුනක කාල පරිච්ඡේදයකට බදු දී තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) බදු දීම සම්බන්ධ මැනුම් කටයුතු 2007 අගෝස්තු 03 දින සිදු කරන විටද එහි එළවළු වෙළඳ සැලක් සහ මාළු වෙළඳ සැලක් ආරම්භ කර තිබුණ අතර, මෙහි බිම් ප්‍රමාණය වර්ග අඩි 452 ක් විය. 2008 අප්‍රේල් 28 දිනදී මුළු බිම් ප්‍රමාණයටම බදු ගිවිසුමක් අත්සන් කර තිබුණි.

(ii) බිම් ප්‍රමාණය අනුව මාසික කුලිය ලෙස රු.45,200 ක් අයවිය යුතු වුවද රු.11,300 ක් පමණක් අයකර තිබුණි. ඒ අනුව මාසයකට රු.33,900 බැගින් වර්ෂ තුනකට රු.1,220,400 ක් පාඩුවක් සිදු වී තිබුණි.

(iii) බදු ගිවිසුම 2010 අගෝස්තු 14 දින අවසන් වී තිබූ නමුත් දේපල ආපසු පවරා ගෙන නැවත බදු දීමට කටයුතු කර නොතිබුණි.

(iv) මාසික තක්සේරු කුලිය රජයේ තක්සේරු කරු මගින් තක්සේරු කරවා ගෙන නොතිබුණි.

(ආ) <u>කැලණිය තොරණ හන්දිය ඉදිරිපස වූ කුඩා බිම් තීරුව බදුදීම</u>

මෙම බිම් තීරුව 2008 ඔක්තෝබර් 30 දින රු.10,356 ක වාර්ෂික කුලියකට බදු දී තිබුණි. වාර්ෂික බදු මුදල රජයේ තක්සේරුකරුගෙන් ලබාගත් තක්සේරුවක් මත තීරණය කර නොතිබුණි.

(ඇ) <u>දළුගම කන්ට්‍රාස් සිනමාහල අසළ පිහිටි ට්‍රාන්ස්පෝමරය තිබූ ඉඩම බදු දීම</u>

දළුගම කන්ට්‍රාස් සිනමාහල අසල ට්‍රාන්ස්ෆෝමරය තිබූ ඉඩම 2006 ජූලි 01 දින සිට වර්ෂ 3 කාලයකට මාසික කුලිය රු.2,300 බැගින් බදු දී තිබුණි.

2009 ජූනි 30 දිනට මෙම බදුකරුගෙන් රු.74,336 ක් හිඟව පැවතියද එය නොසලකා ඉදිරි වර්ෂ 3 ක් සඳහා නැවත බදුදී තිබුණි.

(ඇ) <u>කිරිබත්ගොඩ බස්නැවතුම්පොල පිටුපස බිම් තීරුව බදු දීම</u>

කිරිබත්ගොඩ බස් නැවතුම්පොල භූමියේ උතුරු මායිමේ කාණුවට යාව පිහිටි අඩි 270 ක් දිග අඩි 15 ක් පළල භූමිය වර්ෂ තුනක කාලයකට 2007 අගෝස්තු 01 දින රු.1,100,000 ට බදු දී තිබණි. එම බදු දීමට අදාලව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වාර්ෂික බදු මුදල රජයේ තක්සේරුකරුගෙන් ලබාගත් තක්සේරුවක් මත තීරණය කර නොතිබුණි.

(ii) 2007 අගෝස්තු 17 දින පැවති මුදල් කමිටු රැස්වීමේදී එම බිම් තීරුවේ ඇති කානුව බදුකරුගේ වියදමින් සාදා ගැනීමටත් ඒ හේතවෙන් 2007 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල බදු කුලිය අත්හැරීමටත් තීරණය කර තිබුණි. එම තීරණය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) බදු ගිවිසුමේ 06 ජේදය අනුව බදුගත් ඉඩමේ ස්ථිර ගොඩනැගිලි ඉදි නොකල යුතු වුවද, 2007 නොවැම්බර් 18 දින සකස් කර ඇති අනුබෙදුම් අංක 505/2006 දරන පිඹුරුපත අනුව බදුකරු විසින් අතුරු බදු දීම සඳහා එම භූමියේ කඩ කාමර 26 ක් අනවසරයෙන් ඉදි කර තිබුණි.

(iv) එම අනවසර ඉදි කිරීම් වලට එරෙහිව සභාව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ අතර, 2010 සැප්තැම්බර් 30 දිනට රු.1,064,860 ක් බදු කුලී හිඟව පැවතුණ නමුත්, හිඟ බදුකුලී අයකර ගැනීමටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(v) 2010 සැප්තැම්බර් 30 දිනට මෙම දේපලෙහි බදු කාලය අවසන්ව තිබූ නමුත් මෙම දේපල සභාවට පවරාගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, නැවත බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී ඇති බවද නිරීක්ෂණය විය.

(ඉ) <u>හුණුපිටිය සතිපොළට යාබද වර්ග අඩි 2000 භූමිය බදු දීම</u>

හුණුපිටිය සතිපොළට යාබද වර්ග අඩි 2000 භූමිභාගය 2007 අගෝස්තු 01 දින සිට වසරක කාලයක් සඳහා රු.12,500 ක මාසික කුලි මුදලකට බදු දී තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) බිම් කොටස මැනීම කර එහි වර්ග ප්‍රමාණය තීරණය කර ඒ අනුව සැලසුමක් පිලියෙල කර නොතිබූ අතර, මේ සඳහා ගොනුවක්ද පවත්වා නොතිබුණි.

(ii) බදු කාලය අවසන් වීමෙන් පසු බදුකරුට තවදුරටත් එම භූමිය පාවිච්චි කිරීමට ඉඩ සලසාදී තිබුණි.

(ඊ) <u>ටයර් සංස්ථා හන්දිය බුදු පිළිමයට දකුණු දිශාවෙන් පිහිටි හිස් බිම් කොටස බදුදීම</u>

ටයර් සංස්ථා හන්දිය බුදු පිළිමයට දකුණු දිශාවෙන් පිහිටි හිස් බිම් කොටස 2007 නොවැම්බර් 01 දින සිට 2010 ඔක්තෝබර් 31 දක්වා වර්ෂ තුනකට රු.79,200 ක බදු මුදලකට බදු දී තිබුණි.

(i) පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. මෙම භූමියෙහි අනවසර ඉදි කිරීම් පිළිබඳව 2009 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන්ද පෙන්වා දී ඇති අතර, ඒ සම්බන්ධව කිසිදු නීතිමය ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) අදාළ කාලය සඳහා හිඟ බදු මුදල රු.93,830 ක් විය.

(iii) ගිවිසුම් කාලය අවසන් වුවද, බිම් කොටස ආපසු සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) <u>පොදු කරුණු</u>

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 177 රීතිය ප්‍රකාර මෙම බදුදීම් සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (xi) වගන්තිය ප්‍රකාරව මෙම බදුදීම් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) බදු දීමේදී එම බිම් තීරු යොදාගත හැකි වාණිජ අරමුණ ගිවිසුමට ඇතුළත්ව නොතිබුණි.

(iv) ගිවිසුමේ 06 ඡේදය අනුව ස්ථිර ගොඩනැගිලි ඉදි නොකළ යුතු වුවද ඊට පටහැනිව ස්ථිර ගොඩනැගිලි ඉදිකර තිබුණි.

2.4 <u>වියදම් ව්‍යුහය</u>

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| පෞද්ගලික පඩිනඩි | 52,250 | 57,985 | (5,735) | 52,650 | 55,010 | (2,360) |
| අනෙකුත් | 54,535 | 65,176 | (10,641) | 55,463 | 81,758 | (26,295) |
| උප එකතුව | 106,785 | 123,161 | (16,376) | 108,113 | 136,768 | (28,655) |
| ප්‍රාග්ධන වියදම | 256,950 | 134,568 | 122,382 | 125,395 | 52,190 | 73,205 |
| | 363,735 | 257,729 | 106,006 | 233,508 | 188,958 | (44,550) |
| | ===== | ====== | ======= | ====== | ====== | ===== |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 01 |
| ද්විතියික | 37 | 30 |
| ප්‍රාථමික | 139 | 129 |
| වෙනත් - ආදේශක | - | 58 |
| කොන්ත්‍රාත් | - | 11 |
| | ------ | ------ |
| | 178 | 229 |
| | === | ==== |

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට, පෙර ගෙවුම් ශේෂ වල වටිනාකම රු.4,319,878 ක් වූ අතර, අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.4,269,655 ක් විය.

### 2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.15,707,029 ක් වූ අතර, සේවය අතහැර යාම, ස්ථානමාරු වීම වැනි හෙතුන් මත දැනට සේවයේ නොමැති 24 දෙනෙකුගෙන් අයවිය යුතු අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.51,133 ක් විය.

## 2.7 ආර්ථික නොවූ ගනුදෙනු

<u>බාජ් (Barge) යන්ත්‍රයක් හා එක්ස්කැවේටර් (Excavator) යන්ත්‍රයක් මිලදී ගැනීම</u>

ජාතික සවිය - ගම නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇල මාර්ග පවිත්‍ර කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී බාජ් (Barge) යන්ත්‍රයක් සහ එක්ස්කැවේටර් (Excavator) යන්ත්‍රයක් රු.2,109,648 කට මිලදී ගෙන තිබුණි. පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රසිද්ධ ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීම වෙනුවට අතින් මිල ගණන් ලබා ගෙන තිබුණි.

(ආ) මිලදී ගෙන තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය පාවිච්චි කරන ලද එකක් වූ අතර, එවැනි යන්ත්‍රයක් මිලදී ගැනීමට හේතුව පැහැදිලිකර නොතිබුණි.

(ඇ) යන්ත්‍රය සඳහා තාක්ෂණික පිරිවිතර (specification) සකස් කර ඒ අනුව මිලගණන් ලබාගෙන නොතිබුණි.

(ඈ) යන්ත්‍රය සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන එම යන්ත්‍ර අලෙවිකරණ ආයතන හෝ දේශීය නියෝජිතයන් නොවීය.

(ඉ) තාක්ෂණ ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ දැනුම ඇති පුද්ගලයෙකු ඇතුළත් වී නොතිබූ අතර, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා තාක්ෂණික ඇගයීම් කමිටුවේද සභාපතිවරයා ලෙස කටයුතු කර තිබුණි.

(ඊ) සැපයුම්කරු තෝරා ගැනීමේදී 2004 අගෝස්තු 27 දිනැති අංක 364(4) රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ එකතු කළ අගය සම්බන්ධ නිර්දේශයන්ට පටහැනිව කටයුතු කර තිබුණි.

(උ) මිලදී ගැනීම සඳහා අනුමත මුදල වූ රු.2,000,000 ක් ඉක්මවා රු.109,648 ක් සභා මුදලින් වැයකර තිබුණද ඒ සඳහා සභා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

2.8 <u>අරමුණුවලින් බාහිර ක්‍රියාකාරකම්</u>

ඩෙංගු මර්ධන ව්‍යාපෘතිය සඳහා රු.115,000 කට බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් (Multi Media Projector) මිලදී ගැනීමේදී තාක්ෂණික පිරිවිතර සකස් කර නොතිබුණ අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීමක්ද කර නොතිබුණි.

2.9 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(i) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව අනියම් කාර්ය මණ්ඩලය 56 දෙනෙකු බඳවාගෙන තිබුණි.

2.10 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

(අ) **<u>මාතෙල්ගම කසළ බැහැර කිරීම සඳහා ඉඩමක් මිළදී ගැනීම</u>**

කැලි කසළ බැහැර කිරීම සඳහා කැලණිය මාතෙල්ගම ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු වගුරු බිමකින් අක්කරයක භූමි ප්‍රමාණයක් මිළදී ගැනීම සඳහා රු.5,269,852 ක් 2010 වර්ෂයේදී ගෙවීම් කර තිබුණද, එහි අයිතිය පවරා ගෙන නොතිබුණි. විකුණුම් ප්‍රතිජ්ඨාව තීරණය කිරීමේදී මෙම වගුරුබිමේ ඉදි කිරීමට අපේක්ෂිත ජල පොම්පාගාරයේ ඇස්තමේන්තුගත පිරිවැයද ඇතුලත් කර තිබීම නිසා රු.4,000,000 ක් වැඩියෙන් ගෙවීමට □සිදුව තිබුණි.

(ආ) **<u>කසළ බැහැර කරන ස්ථානයට බොරළු පස් යෙදීම</u>**

බැහැර කරන කසළ වසා දැමීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පස් කියුබ් 915 ක් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.1,397,441 ක් ගෙවා තිබුණ.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) පස් පිරවීම සඳහා එම පෞද්ගලික ආයතනය තෝරා ගත් ආකාරය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) ගොඩනැගිලි කඩා ඉවත් කරන ලද කොන්ක්‍රීට් කැබලි, ගඩොල්, සිමෙන්ති බදාම වැනි ද්‍රව්‍ය කසළ මතට හෙලා තිබූ බැවින් භෞතික පරීක්ෂාවේදී කසළ වසා දැමීම සඳහා පස් කියුබ් 915 ක් යොදාගෙන ඇති බව තහවුරු නොවීය.

(iii) කසළ තුන කිරීම සඳහා ඉහත කී පෞද්ගලික ආයතනයෙන් කුඩා බැකෝ යන්ත්‍රයක් කුලියට ගෙන තිබුන අතර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.3,393,667 ක් ගෙවා තිබුණි. එම ආයතනය මෙම කාර්යය සඳහා තෝරාගත් ආකාරය විගණනයට පැහැදිලි නොකෙරුණි

(ඇ) **<u>කැනන් iR 2318 L වර්ගයේ ජායා පිටපත් යන්ත්‍රයක් මිළදී ගැනීම</u>**

කැනන් iR 2318 L වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂයේදී රු.95,200 ට මිලදී ගෙන තිබුණි.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) මෙම මිලදී ගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 177 රීතිය ප්‍රකාර ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ii) මිලදී ගැනීමට පෙර තාක්ෂණික පිරිවිතර සකස්කර නොතිබුණි.

(iii) ප්‍රාදේශීය සභාවට රු.135,000 කට අලෙවි කර තිබූ ඉහත මාදිලියේ ඡායා පිටපත් යන්ත්‍ර වෙනත් රාජ්‍ය ආයතන වලට රු.86,500 ට අලෙවි කර තිබූ අතර එමනිසා රු.48,500 ක පාඩුවක් සභාවට සිදුවී ඇත.

(iv) සභාවේ තිබූ iR 1600 මාදිලියේ පැරණි ඡායා පිටපත් යන්ත්‍රය රු.50,000 කට තක්සේරුකර පිළිගත් පරිපාටින්ට පටහැනිව නව යන්ත්‍රය මිලදී ගැනීමේදී හිලව් කර තිබුණි. පැරණි යන්ත්‍රය අබලන් තත්ත්වයේ පැවති බව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් විසින් නිර්දේශ කර නොතිබූ අතර, එහි වටිනාකම තාක්ෂණික දැනුමක් ඇති නිලධාරියෙකු විසින් තක්සේරු කර නොතිබුණි.

## 2.11 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) කසළ බැහැර කිරීම වෙනුවෙන් 2006 වර්ෂයේ මාස 04 ක් සඳහා ගෙවිය යුතු වූ රු.1,404,150 ක් නොගෙවීම සම්බන්ධව පෞද්ගලික සමාගමක් සභාවට එරෙහිව පවරා තිබුණ නඩුවේ තීන්දුව පරිදි රු.1,518,000 ක් ගෙවීමට සිදුව තිබුණි. මීට අමතරව නීතිඥ ගාස්තු ලෙස රු.65,000 ක මුදලක්ද ගෙවීමට සිදු වීම නිසා රු.178,850 ක පාඩුවක් සිදුවී තිබුණි. 2011 ජනවාරි වන විට සභාව රු.900,000 ක් එම සමාගමට ගෙවා තිබූ අතර, එහිදී 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට අනුව එකතු කළ අගය මත බදු මුදලින් 33⅓% ක් වූ රු.61,033 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, එසේ කර නොතිබුණි.

(ආ) කිරිබත්ගොඩ බස් නැවතුම්පොළ හරහා දිවෙන ජිනදාස නන්දසේන මාවත හා ඊට සමාන්තරව දිවෙන ඇළ මාර්ගය අතර, බිම් තීරුවේ ඇති අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

## 3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ඇ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පාලනය